සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2025 ජනවාරි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

2025-02-02
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයකම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** සඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට, පුද්ගලයින් හා කණ්ඩායම් සමඟ වැඩ කිරීමට සහ අන්තර් ක්‍රියාකාරීත්වය පවත්වා ගැනීම සඳහාත් අවශ්‍ය වන කුසලතා හඳුන්වනු ලබන්නේ:

(1) විනිශ්චය කිරීමේ (Diagnostic) කුසලතා ලෙසයි.
(2) තාක්ෂණික කුසලතා ලෙසයි.
(3) අන්තර් පුද්ගල (මානව) කුසලතා ලෙසයි.
(4) සංකල්පනාත්මක (Conceptual) කුසලතා ලෙසයි.

**1.2** යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ, ආයතනයක යෙදවුම් සහ නිමැවුම් අතර ඇති සම්බන්ධතාවය වන්නේ:

(1) සඵලදායීත්වයයි.
(2) ඵලදායීතාවයයි.
(3) කළමනාකරණයයි.
(4) කාර්යක්ෂමතාවයයි.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, මානව සම්පත් කළමනාකරණයට අදාලව රැකියා නිර්මාණය කිරීමේදී භාවිත කරන ශිල්ප ක්‍රමය (technique) / ක්‍රමය (method) වන්නේ කුමක් ද?

(1) රැකියා පුළුල් කිරීම (Job Enlargement).
(2) රැකියා භ්‍රමණය කිරීම (Job Rotating).
(3) රැකියා පෝෂණය කිරීම (Job Enrichment).
(4) ඉහත සඳහන් සියල්ලම.

1.4 පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** එය සජීවී, ක්‍රියාකාරී සහ පණ ඇති එකක් වීම.

**(b)** එය සංවිධානයේ අනෙකුත් සියළුම සම්පත් සම්බන්ධයෙන් තීරණ ගනී.

**(c)** එහි හැසිරීම සරල වන අතර, එමනිසා එය පුරෝකතනය කළ හැකිය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන්, ආයතනයක මානව සම්පත සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න:

(1) **(a)** පමණි. (2) **(a)** සහ **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) **(b)** සහ **(c)** පමණි.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, පෝටර්ගේ වටිනාකම් දාමයේ (Porter's Value Chain) ප්‍රාථමික ක්‍රියාකාරකමක් වන්නේ කුමක් ද?

(1) අලෙවිකරණය සහ විකුණුම්. (2) යටිතල පහසුකම්.

(3) මානව සම්පත් කළමනාකරණය. (4) තාක්ෂණික සංවර්ධනය.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

*අංක 1.6 සිට 1.10 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

1.6 තරඟකරුවන්ට සාපේක්ෂව, සන්නමක් හෝ නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් පාරිභෝගික සංජානනයට (perception) බලපෑම් කිරීමේ හැකියාව ………… *(ඉලක්කගතකරණය / ස්ථානගත කිරීම)* ලෙස හඳුන්වනු ලැබේ.

1.7 ………… *(ඒකාබද්ධ කිරීම / අලෙවිකරණය)* යනු සැපයුම්දාම කළමනාකරණයේ මූලිකාංගයකි.

1.8 ………… *(නිෂ්පාදන / නිෂ්පාදිත)* සංකල්පයට අනුව, උසස් ගුණත්වයකින් යුත් භාණ්ඩ සඳහා පාරිභෝගිකයින් වැඩි කැමැත්තක් දක්වති.

1.9 ………… *(වෙළෙඳපොළ වර්ධනය / වෙළෙඳපොළ කොටස)* යනු යම් සමාගමක් විසින් නිශ්චිත කාල සීමාවක් තුළ උපයාගන්නා ලද වෙළෙඳපොළේ සමස්ත විකුණුම් ප්‍රමාණයයි.

1.10 ………… *(ලඟාකරගත හැකි බව / නම්‍යතාවය)* යනු සඵලදායී ඛණ්ඩණය (segmentation) සඳහා වන අවශ්‍යතාවයකි. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

*අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 සාර්ථක සන්නම් නාමයක් සඳහා වන අවශ්‍යතාවයන් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.12 මෙහෙයුම් කළමනාකරණයේදී භාවිත කරනු ලබන තාක්ෂණික ස්වයංක්‍රීයකරණ (automation) ශිල්ප ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

1.13 ජපන් කළමනාකරණ ශෛලියේ ඇති ලක්ෂණ දෙකක්(02) සඳහන් කරන්න.

1.14 ඩිජිටල් අලෙවිකරණයේ ඇති අවාසි දෙකක්(02) සඳහන් කරන්න.

1.15 ප්‍රතිලාභ කළමනාකරණයේ අරමුණු දෙකක්(02) සඳහන් කරන්න. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

වර්තමානයේ පවතින අස්ථාවර ව්‍යාපාරික පරිසරය තුළ, ප්‍රමුඛ පෙළේ ආයතනවල කළමනාකරුවන්ගේ භූමිකාවට වැදගත් තැනක් හිමි වේ. ශ්‍රී ලංකාව තුළ ඉහළ බුද්ධි ගලන මට්ටමක් පවතින බැවින්, තොරතුරු තාක්ෂණය (IT) වැනි සමහර කර්මාන්ත තුළ නිවැරදි දක්ෂ පුද්ගලයින් ආයතන තුළට ආකර්ශනය කර රඳවා තබා ගැනීමේ අභියෝගයක් තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) වර්තමාන අස්ථාවර පරිසරය තුළ, කළමනාකරුවන් මුහුණපාන අභියෝග හතරක්(04) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(b) අලුතෙන් ආරම්භ කරන ලද තොරතුරු තාක්ෂණ ආයතනයක (IT firm) සේවකයින්ගෙන් උපරිම තිමැවුමක් ලබා ගැනීම සඳහා අභිප්‍රේරණයේ සාධාරණත්ව න්‍යාය (Equity Theory of Motivation) භාවිත කළ හැකි ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) "නිලතන්ත්‍රවාදී කළමනාකරණ න්‍යාය (Bureaucratic Management Theory), නූතන තොරතුරු තාක්ෂණ ආයතනයක් සඳහා වඩාත් සුදුසු කළමනාකරණ ප්‍රවේශයයි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

කාර්යබහුල අලෙවිකරණ ආයතනයක, ව්‍යාපෘති නායිකාව (project leader) වන **සාරාට** මහා පරිමාණ අලෙවිකරණ වැඩසටහනක් ඉතා කෙටි කාල සීමාවක් තුළ (tight deadline) නිම කිරීමට සිදුව ඇත. අතීත ව්‍යාපෘතිවල දත්ත විශ්ලේෂණය කිරීමටත්, විවිධ උපායමාර්ගවල වාසි සහ අවාසි මැන බැලීමටත්, ඇය විසින් තම කණ්ඩායම රැස් කරනු ලැබිය. අනාගත ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම සඳහා වන ව්‍යුහගත ප්‍රවේශයක් භාවිත කිරීමෙන්, නියමිත කාලයට සාර්ථකව දියත් කිරීමත් තහවුරු කරමින් හොඳම විකල්පය ඉතා සහයෝගයෙන් ඔවුන් තෝරා ගනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සංවිධානයකට, සැලසුම්කරණය වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සාරාගේ** ආයතනයට මුහුණදීමට සිදුවිය හැකි සැලසුම්කරණය සඳහා වන බාධා (barriers) හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

**සීමාසහිත Green Tech (පෞද්ගලික) සමාගමේ** සංවිධාන ව්‍යුහය, අලෙවිකරණ, ඉංජිනේරු සහ පාරිභෝගික සහාය වශයෙන් එකිනෙකට වෙනස් දෙපාර්තමේන්තුවලින් සමන්විත වේ. සෑම දෙපාර්තමේන්තුවකටම සහයෝගිතාව වර්ධනය වන ආකාරයෙන් පැහැදිලි කාර්යභාරයන් සහ වගකීම් ඇත. නිතිපතා සිදුවන අන්තර් දෙපාර්තමේන්තු රැස්වීම් මගින් ව්‍යාපෘතිවල පෙළගැස්ම තහවුරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Green Tech (පෞද්ගලික) සමාගම** සඳහා සංවිධානකරණයේ (organizing) වැදගත්කම් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සඵලදායී ලෙස අධිකාරී බලය පැවරීමට ඇති බාධා දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) න්‍යාස සංවිධාන ව්‍යුහයක (a Matrix Structure) ඇති වාසි දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත Innovate සමාගමේ** නායකත්ව මණ්ඩලය විසින් ආයතනයේ සන්නිවේදනය වැඩි දියුණු කිරීම සඳහා දෙසතියකට වරක් පළ කරනු ලබන පුවත් ලිපියක් (newsletter) ආරම්භ කරන ලදී. මෙම පුවත් ලිපිය මඟින් ව්‍යාපෘතිවල ප්‍රගතිය, සේවකයින්ගේ කාර්යසාධන ළඟාකර ගැනීම් සහ ඉදිරි වැඩකටයුතු පිළිබඳව අවධාරණය කරනු ලබයි. මීට අමතරව ප්‍රතිචාර සහ අදහස් බෙදා ගැනීමට සේවකයින් සඳහා විවෘත සංවාද පවත්වනු ලබයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සහයෝගීතාවය වැඩි දියුණු වන අතර, සේවකයින් හට වඩාත් සමීප බවක් සහ දැනුවත්භාවයක් ලබා දේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) නූතන ව්‍යාපාර සංවිධානයක් තුළ, සන්නිවේදනය අත්‍යවශ්‍ය කාර්යයක් බවට පත්වීමට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සංවිධානයකට, අවිධිමත් සන්නිවේදනයක් තිබීමෙන් ඇති වන වාසි දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) වර්තමානයේදී, මානව සම්පත් කළමනාකරණයේ ඇති නවෝත්පාදනයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත Future Tech (පෞද්ගලික) සමාගමේ**, ප්‍රධාන විධායක නිලධාරිනිය (Chief Executive Officer) වන **ලිසා** විසින් සම්ප්‍රදායික මෘදුකාංගයේ සිට කෘත්‍රිම බුද්ධියෙන් (AI) ක්‍රියාත්මක විසඳුම් වෙත යොමුවීම සඳහා ඉතා දැඩි නව උපායමාර්ගයක් ක්‍රියාත්මක කරනු ලබයි. වෙනසක අවශ්‍යතාවය හඳුනා ගනිමින් මෙම සංක්‍රාන්තිය මෙහෙයවීම සඳහා ඇයගේ කළමනාකරුවන් බලගැන්වීම උදෙසා නායකත්ව වැඩමුළු ගණනාවක් ඇය විසින් සංවිධානය කරන ලදී. නවෝත්පාදන සහ විවෘත සන්නිවේදන සංස්කෘතිය ආයතනය තුළ බල ගන්වමින් සමාගමේ නවතම දැක්ම වන තරඟකාරී වෙළෙඳපොළ ජය ගැනීම සඳහා සෑම අයෙකුගේම කාර්යභාරය පිළිබඳ අවබෝධය තහවුරු කරමින් **ලිසා** තම කණ්ඩායම වෙනස්වීම සඳහා පොළඹවනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Future Tech (පෞද්ගලික) සමාගම** සඳහා වන උපායමාර්ගයක කාර්යභාරයන් (භූමිකා) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) හොඳ උපායමාර්ගයක ලක්ෂණ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) වෙනසෙහි බලවේග දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

**ඇන්, සීමාසහිත Sunshine (පෞද්ගලික) සමාගමේ** ප්‍රධාන විධායක නිලධාරිනිය (CEO) වන අතර ඇය, නිර්මාණශීලීත්වය වැඩි දියුණු වන ආකාරයේ සහයෝගිතා සංස්කෘතියක් පවත්වා ගනිමින් ක්‍රියාශීලී නායකත්වයක් පෙන්නුම් කරයි. ඇය විසින් කණ්ඩායම් අතර විවෘත සන්නිවේදනය දිරිමත් කරන අතර, සේවකයින් අතර නිදහස් අදහස් හුවමාරු කර ගැනීමට බලගන්වනු ලැබේ. මෙම ප්‍රවේශය මගින් චිත්ත ධෛර්ය ඉහළ නැංවීම පමණක් නොව, සමාගමේ තරගකාරීත්වය සඳහා අත්‍යාවශ්‍ය වන නවෝත්පාදනයන්ට ද මඟ පාදයි.

ශක්තිමත් අලෙවිකරණ උපායමාර්ගයක අවශ්‍යතාවය හඳුනා ගනිමින්, **මාර්ක්ගේ** මෙහෙයවීමෙන් යුත් අලෙවි කළමනාකරණ කණ්ඩායම, නව ප්‍රවණතා සහ පාරිභෝගිකයින්ගේ මනාපයන් හඳුනාගැනීම සඳහා වෙළෙඳපොළ පර්යේෂණයක් සිදුකරන ලදි. සන්නාම දෘශ්‍යතාව සහ පාරිභෝගික බැඳීම වැඩි දියුණු කිරීමේ අරමුණෙන් ඔවුන්ගේ නවතම නිෂ්පාදිතයේ විශේෂිත ලක්ෂණ ඉස්මතු කරන බහුවිධ ප්‍රචාරණ ව්‍යාපාරයක් නිර්මාණය කරන ලදි. සමාජ මාධ්‍යය, බලපෑම්කාරී හවුල්කාරීත්වය සහ ඉලක්කගත වෙළෙඳ දැන්වීම් ආධාරයෙන් ඔවුන් සඵලදායී ලෙස නව පාරිභෝගිකයින් වෙත ළඟා විය.

ඊට සමගාමීව, ශ්‍රම බලකාය වෙළෙඳපොළ වෙනස්වීම්වලට කඩිසරව ප්‍රතිචාර දැක්වීම තහවුරු කිරීම සඳහා සේවකයින්ගේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා ද මානව සම්පත් කළමනාකරු වන **ජෝන්**, ඉලක්කගත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. වෘත්තීමය සංවර්ධනය සහ ධනාත්මක සේවා පරිසරයක් ඇති කිරීම තුළින් අභියෝගවලට මුහුණ දිය හැකි අභිප්‍රේරිත කණ්ඩායමක් ඔහු විසින් නිර්මාණය කරයි. තවද, සමාගමට සේවකයින් බඳවා ගැනීමෙන් පසු අනුස්ථාපන වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම මුලපිරීම් දිග හැරීමත් සමඟින්, **ඇන්** සමාගමේ දිගුකාලීන අරමුණු එහි මෙහෙයුම් හැකියාවන් සමඟ පෙළගැස්වීම සඳහා උපායමාර්ගික කළමනාකරණ මූලධර්ම හඳුන්වාදෙන ලදි. මැනිය හැකි ඉලක්ක පිහිටුවීම සහ නිතිපතා ප්‍රගතිය සමාලෝචනය කිරීම මීට ඇතුළත් වේ. නායකත්වය, අලෙවිකරණය, මානව සම්පත් සහ තිරසාර වර්ධනය සඳහා වන නව්‍යකරණය පිළිබඳ තීක්ෂණ බුද්ධිය ඒකාබද්ධ කිරීම තුළින් නවෝත්පාදන, සේවක තෘප්තිය සහ උපායමාර්ගික පෙළගැස්ම තහවුරු කරන අතර, එමඟින් ආයතනය තරගකාරී මාවතකට යොමු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Sunshine (පෞද්ගලික) සමාගමේ** සහයෝගිතා සංස්කෘතිය පෝෂණය කිරීමට සහ සේවකයින් අතර නවෝත්පාදනයට **ඇන්ගේ** නායකත්ව විලාසය, දායක වන ආකාර තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සීමාසහිත Sunshine (පෞද්ගලික) සමාගම** සඳහා සන්නාමකරණය (branding) වැදගත් වන්නේ ඇයිද යන්නට හේතු තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(c) **සීමාසහිත Sunshine (පෞද්ගලික) සමාගමට** අනුස්ථාපනය (induction) වැදගත් වන්නේ ඇයිද යන්නට හේතු හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) **සීමාසහිත Sunshine (පෞද්ගලික) සමාගමේ** උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියේදී, තත්ත්ව (ස්ථානීය) විගණනය (position audit) වැදගත් ක්‍රියාකාරකමක් වන ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(e) සමස්ත තත්ත්ව කළමනාකරණයේ [Total Quality Management (TQM)] මූලධර්ම පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව නිර්ණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය නිර්ණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |